# දුම්බීම හා ප්‍රජනන සෞඛ්‍යය

වෛද්‍ය ඩී.පී. අතුකෝරාළ



ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්ණය කර ඇති පරිදි ජීවිතයේ සැම අවස්ථාවකදීම මනුවන ප්‍රජනන පද්ධතිය සම්බන්ධ ශාරීරික, මානසික හා සාමාජීය කරුණුවල සුහසාධනය ප්‍රජනන සෞඛ්‍යය ලෙස සැලකිය හැකිය. සැහීමට පත්විය හැකි ලිංගික ජීවිතයක් ගතකළ හැකි වීම හා ප්‍රජනන හැකියාව මින් අදහස් කෙරෙයි. මෙහිදී දුම්බොන අයගෙන් සියයට 50 ක් පමණම නෂ්ට කාමයෙන් පෙළෙන බව පෙනී ගොස් තිබේ. එංගලන්තයේ කරන ලද පරීක්ෂණයකදී දුම් නොබන අය මෙන් දෙගුණයක් දුම් බොන අය මෙම තත්ත්වයට පත්වන බව හෙළිවී ඇත.

දියවැඩියා රෝගීන් අන් අයට වඩා නෂ්ට කාමයෙන් පෙළෙන බව පිළිගැනීමයි. එහෙත් දුම් බොන දියවැඩියා රෝගීන් එම තත්ත්වයට පත්වීමේ අවදානම බෙහෙවින් ම වැඩිය.

දුම් නොබොන නමුත් අක්‍රිය දුම්පානය නොහොත් වෙනත් අය පිටකරන දුම් ආඝ්‍රාණය කිරීම නිසා ඔවුන් ද මීට ගොදුරු වීමට ඇති ඉඩකඩ බොහෝය. සිගරට් දුමෙහි ඇති කාබන් මොනොක්සයිඩ් වැනි විෂ ද්‍රව්‍ය රුධිර ධාවනයට එක්වී හානි පැමිණවීම නිසා මෙම තත්ත්වයත් පහළ වෙයි. දුම්බීම නැවැත්වූ විට හෝ අඩුකළ විට ඒවා මගහැරී යයි.

විවිධ පරීක්ෂණවලදී පෙනී ගොස් ඇති අන්දමට දුම්බීම නිසා ගැහැනු පිරිමි දෙපාර්ශ්වයේ ම ලිංගික හෝමෝන පරිවෘත්තියේ වෙනස්කම් ඇතිවිය හැකිය. දුම්බොන වනිතාවන්ගේ අර්තවභාවය (ඔසප් නැවතීම) කලින් සිදුවන්නේ මේ නිසා වියහැකි යැයි අනුමාන කෙරේ. පුරුෂ ගති ලක්ෂණ ඇතිවන ඇන්ඩ්‍රොජන්වල අසාමාන්‍ය මට්ටම් ද දැකිය හැකිය.සතුන් ඇසුරින් කරන ලද පරීක්ෂණවලදී හෙළිවී ඇති පරිදි දුම්කොළවල ඇති විෂ ද්‍රව්‍ය වෘෂණ කෝෂවලට හානි පමුණුවයි.

දුම්බොන පිරිමින්ගේ ශුක්‍රාණු ප්‍රමාණය අඩුවනවාත් හැර සෑහෙන ප්‍රමාණයක් විකෘතිව ද නිර්මාණය වෙයි. දුම්බීම නැවැත් වූ විට ඒවායේ ප්‍රමාණය හා ගුණාත්මක භාවය ද වැඩිවේ. වාසනාවකට මෙන් ශ්‍රී ලංකාවේ දුම්බොන වනිතාවන් බහුල නොවේ. ගර්භණී අවස්ථාවේ සක්‍රීය හෝ අක්‍රීය දුම්බීම නිසා කළල වර්ධනය හීන වෙයි. එමනිසා බර අඩු දරුවන් බිහි වේ.

ගබ්සාව, ප්‍රසූතිය මරණය ද සිදුවිය හැකිය. එසේ ම ගර්භාෂයෙන් පිට ගැබ් ගැනීම් ද ඇතිවිය හැකිය. සක්‍රීය සහ අක්‍රීය දුම්පානය නිසා තොල හා තල්ල විකෘති දරුවන් බිහිවන බව ද පෙනී ගොස් තිබේ.